සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණක් යොදන්න.

01. හැරල්ඩ්. ඩී. ලැස්වෙල් ආකෘතිය මගින්,
(1) ප්‍රතිපෝෂණය පිළිබඳ අවධානය යොමු කරයි.
(2) රේඛීය සන්නිවේදන ලක්‍ෂණ පෙන්නුම් කරයි.
(3) සන්නිවේදන බාධක හඳුන්වා දෙයි.
(4) චක්‍රීය සන්නිවේදන ලක්‍ෂණ පෙන්නුම් කරයි.

02. සන්නිවේදනයේ මූලික කාර්යයක් වන්නේ,
(1) සබකෝලය (2) ප්‍රදීපාගාර උපක්‍රමය
(3) දොරටුපාල සංකල්පය (4) විනෝදාස්වාදය

03. ශ්‍රී ලංකාවේ පළමුවන සිංහල මාධ්‍ය පුවත්පත වන්නේ,
(1) දිනමිණ (2) ලක්මිණි පහන (3) ලංකා ලෝකය (4) කලම්බු ජර්නල්

04. කැමරාව බිහි වීමට අවශ්‍ය මූලික පදනම ගොඩනැගෙන්නේ,
(1) සේයා පටල මගිනි (2) කැමරා ඔබ්ස්කියුරාව මගිනි
(3) කැමරා කාච මගිනි (4) ද්වාරය මගිනි

05. ලේඛනයක පිටපතක් ලබා ගැනීම සඳහා යොදා ගනු ලබන යන්ත්‍රය වන්නේ,
(1) ඩොට් මුද්‍රණ යන්ත්‍රයයි. (2) ඡායා පිටපත් යන්ත්‍රයයි.
(3) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි. (4) ඉන්ක්ජෙට් මුද්‍රණ යන්ත්‍රයයි.

06. පාර මාරු වීම සඳහා සුදු ඉර අසලට පැමිණි නයනාට වේගයෙන් එන මෝටර් රථයක් පෙනේ. මීලඟට කළ යුතු කාර්යය සඳහා ඇයට උදව් වන සන්නිවේදන වර්ගය වන්නේ,
(1) අන්තර් වර්ති පුද්ගල සන්නිවේදනය. (2) අන්තර් පුද්ගල සන්නිවේදනය.
(3) දෘශ්‍ය සන්නිවේදනය. (4) ශ්‍රව්‍ය සන්නිවේදනය.

07. බස්රථ වලදී ද, මහ මගෙහිදී ද, වෙළඳසැල්වල දී ද, සිංහල, දෙමළ හා මුස්ලිම් ජනයා අඩු වැඩි වශයෙන් සිටිති. හමුවෙති. කතා කරති. මෙය,
(1) ස්ත්‍රී පුරුෂ සමාජ භාවයයි. (2) පුරවැසිභාවයයි.
(3) මානවහිමිකම්ය. (4) වර්ගිකත්වයයි.

08. කාචයේ නාභිය දුර වැඩිවෙත්ම,
(1) කාච කෝණය විශාල වේ. (2) කාච කෝණය පටු වේ.
(3) ආලෝකය වැඩි වේ. (4) ආලෝකය අඩු වේ.

09. මුද්‍රණය සඳහා ඉදිරිපත් කරන පළමු ලේඛනය හඳුන්වන්නේ,
(1) අකුරු යෝජනය නමිනි. (2) පිටු සැලසුම් කිරීම නමිනි.
(3) අත් පිටපත නමිනි. (4) පිටපත්කරණය නිමිනි



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

10. ශ්‍රී ලංකාවේ පුවත්පත් ඉතිහාසය තුළ ආරම්භ කරන ලද ප්‍රථම පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය ලෙස සැලකෙන්නේ,

(1) දවස පුවත්පත් සමාගම. (2) විජය පුවත්පත් සමාගම.

(3) උපාලි පුවත්පත් සමාගම. (4) ලේක් හවුස් පුවත්පත් සමාගම.

11. අන්තර් පුද්ගල සන්නිවේදනය සාර්ථකව සිදු නොවන අවස්ථාවක් වන්නේ,

(1) හොඳින් සවන් දීම.

(2) සහකම්පනයෙන් යුතුව කතා කිරීම.

(3) සුහද ආචාර ධර්ම අනුගමනය නොකිරීම.

(4) එකිනෙකා අගය කිරීම.

12. මිනිසා භාෂාවක් බිහි කර ගැනීමට පෙර අවාචික සන්නිවේදනයේ යෙදුන ආකාරයකි.

(1) අණබෙර මගින් අදහස් ප්‍රකාශ කිරීම. (2) චිත්‍ර මගින් අදහස් ප්‍රකාශ කිරීම.

(3) ලේඛන මගින් අදහස් ප්‍රකාශ කිරීම. (4) කථනය මගින් අදහස් ප්‍රකාශ කිරීම.

13. ජන මාධ්‍යයේ ප්‍රධාන වර්ගීකරණය වන්නේ,

(1) විද්‍යුත් මාධ්‍ය හා දෘෂ්‍ය මාධ්‍යයයි. (2) මුද්‍රිත මාධ්‍ය හා ශ්‍රව්‍ය මාධ්‍යයයි.

(3) විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍යයයි. (4) දෘෂ්‍ය මාධ්‍ය හා ශ්‍රව්‍ය මාධ්‍යයයි.

14. ඡායාරූපයක් වඩාත් පැහැදිලි හා තීව්‍ර භාවයකින් යුතු වේ නම්,

(1) එහි ගුණාත්මකභාවය වැඩි ලෙස සලකයි.

(2) එහි ගුණාත්මක භාවය අඩු ලෙස සලකයි.

(3) අසාර්ථක ඡායාරූපයක් ලෙස සලකයි.

(4) වර්ණ ඡායාරූපයක් ලෙස සලකයි.

15. විනිවිද පත්‍ර භාවිත කල හැකි ප්‍රක්ෂේපණ උපකරණයක් වන්නේ,

(1) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (2) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය.

(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (4) ප්‍රති ශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය.

16. ග්‍රාහක ක්ෂේත්‍රය වෙත සම්ප්‍රේෂණය කරනු ලබන පණිවිඩය පිළිබඳ පාලනයක් සිදු කළ හැකි පුද්ගලයෙක් හෝ පිරිසක් වන්නේ,

(1) නියාමකයින්ය. (2) දොරටුපාලකයින්ය.

(3) සංස්කාරකයින්ය. (4) දේශකයින්ය.

17. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකාරීත්වයේ ප්‍රධාන වර්ගීකරණය වන්නේ,

(1) වානිජ මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍යය. (2) පෞද්ගලික මාධ්‍ය හා සමාගම් මාධ්‍යය.

(3) රාජ්‍ය මාධ්‍ය හා සමාගම් මාධ්‍යය. (4) රාජ්‍ය මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍යය.

18. ලියාපදිංචි කරන ලද පළමුවන සිංහල මාධ්‍ය පුවත්පත වන්නේ,

(1) ලක්මිණි පහන. (2) ලංකාලෝකය. (3) කවට කතිකයා. (4) සත්‍ය මාර්ගය.

19. පරිගණක මූලධර්ම යොදා සකස් කරන ලද කාර්යාලීය මාධ්‍ය උපකරණයක් වන්නේ,

(1) නිල මුද්‍රාව (2) දින මුද්‍රාව (3) දුරකථන යන්ත්‍රය (4) ගණක යන්ත්‍රය

20. වැඩලෝකයේ පවතින මිනිස් ශ්‍රම ඉල්ලුම අනුව සැපයුම සිදු නොවීම සාමාන්‍යයෙන් පවතින ලක්ෂණයකි. එයට හේතුව වන්නේ,

(1) වැඩ ලෝකය හා මිනිසා අතර නොගැළපීමයි.


(2) සමාජය හා තරුණ පරපුර අතර නොගැළපීමයි.

(3) අධ්‍යාපනය හා සමාජය අතර නොගැළපීමයි.

(4) අධ්‍යාපනය හා වැඩලෝකය අතර ඇති නොගැළපීමයි.

21. ස්වාධීන රූපවාහිනී සේවාව ආම්භ වූයේ කිනම් වර්ෂයේ ද?

(1) 1976 (2) 1978 (3) 1974 (4) 1980

22.  මෙම විධිමත් සන්නිවේදන ආකෘතිය,

(1) වයි ආකෘතිය වේ. (2) දාම ආකෘතිය වේ. (3) චක්‍රීය ආකෘතිය වේ. (4)රෝද ආකෘතිය වේ.

23. පණිවිඩයකට අර්ථය ලබා දෙන ප්‍රධානතම තැනැත්තා වන්නේ,

(1) විචාරකයා (2) දේශකයා (3) ග්‍රාහකයා (4) සන්නිවේදකයා

24. සන්නිවේදන වර්ගීකරණය පහත දැක්වේ.

A - පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවන සන්නිවේදනය.

B - ගුවන්විදුලිය පාදක කර ගෙන සිදුවන සන්නිවේදනය.

C - තමන් තමන් සමගම කරනු ලබන සන්නිවේදනය.

D - විශාල පිරිසක් සමග සිදු කෙරෙන සන්නිවේදනය.

සන්නිවේදන වර්ගීකරණය නිවැරදිව දැක්වෙන අනුපිළිවෙල වන්නේ,

(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, ජන සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය

(2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, ජන සන්නිවේදනය

(3) අන්තර් පුද්ගල සන්නිවේදනය, ජන සන්නිවේදනය, අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, ජන සන්නිවේදනය

(4) අන්තර් පුද්ගල සන්නිවේදනය, ජන සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය.

25. ද්වි පුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාවක් නොවන්නේ,

(1) ගැටුම් නිරාකරණය. (2) සතුට අත්කර නොගැනීම.

(3) බලවත් ආවේග පිටකර ගැනීම. (4) පෙළඹවීම.

26. තාරුක සහභාගී වූ ක්‍රිකට් තරගාවලිය නැරඹීමට යහළුවන් පැමිණි අතර ඔහු තරගයේ වීරයා බවට ප්‍රකාශ වූ අවස්ථාවේ දී ඔවුන් ප්‍රීති ඝෝෂා නැගීය. මෙහි දී යහළුවන් නියෝජනය කරන අවාචික සන්නිවේදනය අවකාශය වන්නේ,

(1) සහෘද අවකාශය. (2) සාමාජීය අවකාශය.

(3) පෞද්ගලික අවකාශය. (4) පොදු අවකාශය.

27. නිර්වාචික සන්නිවේදනය පිළිබඳ යහළුවන් සතර දෙනෙක් අතර ඇති වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

සනුක - මුහුණින් හා ඇස් වලින් කරන ප්‍රකාශයක් මෙයට අයත්

දිනුක - දෙදෙනෙක් අතර කතා බහකදී අතින් ඇල්ලීමක් මෙයට අයත්

විනුක - ඇඳුම හා පෙනුම මෙයට අයත්

රනුක - බියට පත් වූ අවස්ථාවක දී බ.. යා.. යි ලෙස ප්‍රකාශ කිරීමත් මෙයට අයත්

ඉහත ප්‍රකාශ අතරින් නිර්වාචික සන්නිවේදනය හා ගැලපෙන අදහස් ප්‍රකාශ කර ඇත්තේ,

(1) සනුක හා දිනුක පමණි.

(2) විනුක හා රනුක පමණි.

(3) දිනුක හා විනුක පමණි.

(4) සනුක, දිනුක, විනුක හා රනුක යන සියල්ලන්මය.

28. ඡායාරූපයක වස්තුවක් පැහැදිලිව තිබිය දී පසුබිම අපහැදිලි කිරීමට අවශ්‍ය වූ විට දී,

(1) ද්වාර වේගය අඩු කළ යුතුය. (2) කාච විවරය වැඩි කළ යුතුය.

(3) නාභිදුර වැඩි කළ යුතුය. (4) වස්තු දුර අඩු කළ යුතුය.

29. යම් සංදේශයක් එක් අයෙකුගෙන් තවත් අයෙකුට ද වශයෙන් දෙතුන් දෙනෙකුගෙන් පසු එම සංදේශය වැඩි දෙනෙකු අතර පැතිරී යයි. මෙය,

(1) වයි ආකෘතිය වේ. (2) රෝද ආකෘතිය වේ.

(3) චක්‍රීය ආකෘතිය වේ. (4) දාම ආකෘතිය වේ.

30. සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය ඉදිරිපත් කිරීමට දායක වූ අයෙක් වන්නේ,
(1) ක්ලෝඩ් ෂැනොන්ය. (2) හැරල්ඩ්. ඩී. ලැස්වෙල්ය.
(3) විල්බර් ශ්‍රාම්ය. (4) ශ්‍රාම් ඔස්ගුඩ්ය.

31. හඬ පාදක කරගෙන සිදු වන සන්නිවේදනය
(1) අවාචික සන්නිවේදනයයි. (2) දෘශ්‍ය සන්නිවේදනයයි.
(3) වාචික සන්නිවේදනයයි. (4) ශ්‍රව්‍ය සන්නිවේදනයයි.


32. රාජකාරී ලිපියක අන්තර්ගත නොවිය යුත්තේ,
(1) යවන්නාගේ නම (2) ලිපියේ මාතෘකාව (3) අශිර්වාදය (4) අන්තර්ගතය

33. රූපාක්ෂර දක්නට ලැබෙන්නේ,
(1) ජපානය, නෙදර්ලන්තය, තායිලන්ත අක්ෂරවලය.
(2) චීනය, ඉන්දියාව, ඕස්ට්‍රේලියා අක්ෂරවලය.
(3) චීනය, ඇමරිකා, ඉතාලි අක්ෂරවලය.
(4) ජපානය, චීනය, කොරියා අක්ෂරවලය.

34. සිංහල, ඉංග්‍රීසි, දෙමළ හෝඩිවල නිවැරදිව අක්ෂර අනුපිළිවෙල වන්නේ,
(1) අක්ෂර 26, අක්ෂර 60, අක්ෂර 247 (2) අක්ෂර 247, අක්ෂර 26, අක්ෂර 60
(3) අක්ෂර 60, අක්ෂර 26, අක්ෂර 247 (4) අක්ෂර 26, අක්ෂර 247, අක්ෂර 60

35. අතීතයේ පණිවුඩ ගෙන යාම සඳහා යොදාගත්, ලොව පුරා ජනප්‍රිය වූ ක්‍රමයක් වන්නේ,
(1) පුහුණු කරන ලද බල්ලන් යොදා ගැනීම.
(2) පුහුණු කරන ලද පරෙවියන් යොදා ගැනීම.
(3) පුහුණු කරන ලද පූසන් යොදා ගැනීම.
(4) පුහුණු කරන ලද කපුටන් යොදා ගැනීම.

36. ''කිසියම් කෙනෙක්, යම් කිසිවක්, කිසියම් කාලයකින් යම් කෙනෙකුට, යම් බලපෑමක් සඳහා ඉදිරිපත් කරන දෙය සන්නිවේදනයයි''
සන්නිවේදනය පිළිබඳ මෙම අර්ථකථනය ඉදිරිපත් කර ඇත්තේ,
(1) වොරන් විවර් විසිනි. (2) හැරල්ඩ්. ඩී. ලැස්වෙල් විසිනි.
(3) චාල්ස් කූලි විසිනි. (4) ක්ලෝඩ් ෂැනොන් විසිනි.

37.


ද්විමාර්ගික සන්නිවේදන සූත්‍රයට අනුව ඉහත රූප සටහනේ A, B, C හි නිවැරදි පිළිවෙල වන්නේ,
(1) සංදේශය, සන්නිවේදකයා, ග්‍රාහකයා
(2) සන්නිවේදකයා, සංදේශය, ප්‍රතිපෝෂණය
(3) සංදේශය, මාධ්‍ය, ග්‍රාහකයා
(4) සන්නිවේදකයා, මාධ්‍ය, ග්‍රාහකයා

38. ආයතනයක් තුළ පහළ කාර්ය මණ්ඩලවල අදහස් ඉහළ තනතුරු දරන්නන් වෙත ඉදිරිපත් කිරීම හඳුන්වන්නේ,
(1) පහළ සිට ඉහළට සන්නිවේදනය. (2) ඉහළ සිට පහළට සන්නිවේදනය.
(3) හරස් සන්නිවේදනය. (4) අවිධිමත් සන්නාවේදනය.

39. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ වාසි වනුයේ,
(1) අඩු පිරිවැය, ආකර්ශනීය නිමාව, ඉක්මන් බව.
(2) ඉක්මන් බව, වැඩි පිරිවැය, පහසුව.
(3) පහසුව, ප්‍රමාද බව, ආකර්ශනීය බව.
(4) කාර්යක්ෂම බව, වැඩි පිරිවැය, ඉක්මන් බව.

40. සන්නිවෙදන බාධක අවම වශයෙන් පැවතිය හැකි අවස්ථාවක් වන්නේ,
(1) ගුවන්විදුලියේ හඬ සුසර නොවීම.
(2) දුරකථනයේ සංඥා අපහැදිලි වීම.
(3) සන්නිවේදකයා විසින් ග්‍රාහකයාට ගැලපෙන භාෂාවකින් කතා කිරීම.
(4) කියවමින් සිටි පොතේ තීන්ත බොඳ වී තිබීම.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

## 10 ශ්‍රේණිය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

| නම/ විභාග අංකය: |
|---|

වැදගත් :

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

01. සිතුමී සහ පැතුමී නිවුන් සහෝදරියන් දෙදෙනෙකි. එහෙත් දෙදෙනා එකිනෙකාට හාත්පසින්ම වෙනස් වූ චරිත ලක්ෂණ වලින් යුතු වේ. සිතුමී කතාවට බෙහෙවින් දක්ෂය. නිතරම කථික තරගාවලි වලින් ජයග්‍රහනය ලබන ඇය මේ වනවිට ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවක ළමා නිවේදිකාවක් ද වේ. පැතුමී ලැජ්ජාශිලී තැනැත්තියකි. එහෙත් ඇයට නිර්මාණශිලීව රචනා මෙන්ම කෙටිකතා ලිවීමේ හැකියාව ඇත.

(i) සිතුමී සහ පැතුමී දක්ෂතා දක්වන සන්නිවේදන ස්වරූප දෙක නම් කරන්න.

(ii) සිතුමී නිවේදනය වෘත්තිය සිදු කරන මාධ්‍ය තුළ ඇතිවිය හැකි බාධක වර්ග දෙක නම් කරන්න.

(iii) පැතුමීගේ රචනා ළමා පුවත්පතක නිතර පළ වේ. ජනමාධ්‍ය වර්ගීකරණයේ දී පුවත්පත කුමන මාධ්‍යයට අයත් වේ ද?

(iv) සිතුමී දක්ෂ නිවේදිකාවකි. ඒ සඳහා ඇයට උපකාරීවන ''ප්‍රදීපාගාර උපක්‍රමය'' පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(v) පැතුමී තම නිර්මාණ කාර්යය සඳහා භාෂාව අපූර්වත්වයෙන් යුතුව යොදා ගනී. භාෂාවේ මූලික කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(vi) වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනයට සිතුමීට කළ හැකි කාර්යයන් දෙකක් ලියන්න.

(vii) පැතුමී සබකෝලයෙන් යුතු තැනැත්තියකි. සබකෝලය යන්න කෙටියෙන් හඳුන්වන්න.

(viii) වාචික සන්නිවේදනයේ දී භාෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන අංග දෙකක් නම් කරන්න.

(ix) සිතුමී සහ පැතුමී ජනමාධ්‍ය සමග ගනුදෙනු කරයි. ජනමාධ්‍ය සමාජය කෙරෙහි ධනාත්මක හෝ ඍණාත්මකව කටයුතු කරන ආකාර දෙකක් ලියන්න.

(x) අවාචික සන්නිවේදනයේ සාධක දෙකක් නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) (i) අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගන්නා තාක්ෂණික මෙවලම් දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) නිර්වාචික සන්නිවේදන විධික්‍රම දෙකක් විස්තර කරන්න. (ල. 02)

(iii) සන්නිවේදනයේ මූලික කාර්යයන් තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) දුරකථනයේ, කථනයට සම්බන්ධවන දෙපාර්ශවයම පිළිපැදිය යුතු ආචාර ධර්ම හතරක් පිළිබඳ විස්තර කරන්න. (ල. 04)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(03) (i) අභිසාරිතාව යන්න හඳුන්වන්න. (ල. 01)

(ii) සමූහ සන්නිවේදනයේ විශේෂතා දෙකක් විස්තර කරන්න. (ල. 02)

(iii) සන්නිවේදන මූලිකාංග තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) ජන සන්නිවේදනයේ ලක්‍ෂණ හතරක් විස්තර කරන්න. (ල. 04)

(04) (i) පොතක් නිර්මාණයේ දී නිමි කටයුතු සඳහා භාවිතා කරන උපකරණ දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා දෙකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

(iii) ජංගම දුරකථනය බහුවිධ උපකරණයකි. මෙම ප්‍රකාශය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) පහත සඳහන් කාර්යාලීය මාධ්‍ය උපකරණ හතර පිළිබඳව විස්තර කරන්න. (ල. 04)

A - දින මුද්‍රා යන්ත්‍රය B - නිල මුද්‍රාව

C - ගණක යන්ත්‍රය D - පරිගණකය

(05) (i) කාන්දම් ලැල්ලේ (චුම්භක පුවරුව) ප්‍රයෝජන දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) පන්ති කාමරය තුළ මාධ්‍ය උපකරණ භාවිතය මගින් ලැබෙන ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ල. 02)

(iii) විද්‍යුත් තැපැල භාවිතා කිරීමේ වාසි තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) පහත සඳහන් A හා B තොරතුරු හුවමාරුව සඳහා යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

A - ෆැක්ස් යන්ත්‍රය B - වෙබ් අඩවි (ල. 04)

(06) (i) ශ්‍රී ලංකා රජයට අයත් රූපවාහිනී සේවාවක් සහ ගුවන්විදුලි සේවාවක් නම් කරන්න. (ල. 01)

(ii) ගුවන්විදුලි ආයතනයක් තුළ ක්‍රියාත්මක අංශ දෙකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

(iii) අංකිත හෙවත් ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) පහත දැක්වෙන ප්‍රක්ෂේපණීය උපකරණ පිළිබඳ විස්තර කරන්න.

A බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය

B අන්තර් ක්‍රියාකාරී පුවරුව (ල. 04)

(07) (i) රසඥතාව යනු කුමක් ද? (ල. 01)

(ii) ඡායාරූපකරණයේ දී යොදා ගන්නා කාච වර්ග දෙකක් පිළබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(iii) සන්නිවේදන ස්වරූප තුනක් පිළබඳ පැහැදිලි කරන්න. (ල. 03)

(iv) අවිධිමත් සන්නිවේදන ආකෘති දෙකක් ඇඳ විස්තර කරන්න. (ල. 04)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(4) | 3 -(3) | 4 -(2) | 5 -(2) | 6 -(1) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(4) |
| 11-(3) | 12 -(2) | 13 -(3) | 14 -(1) | 15 -(4) | 16 -(2) | 17 -(4) | 18 -(1) | 19 -(4) | 20 -(4) |
| 21-(1) | 22 -(2) | 23 -(3) | 24 -(3) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(2) | 29 -(1) | 30 -(1) |
| 31-(4) | 32 -(3) | 33 -(4) | 34 -(3) | 35 -(2) | 36 -(2) | 37 -(4) | 38 -(1) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

01. (i) වාචික සන්නිවේදනය / ලිඛිත සන්නිවේදනය

(ii) අර්ථ බාධක, මාධ්‍ය බාධක

(iii) මුද්‍රිත මාධ්‍ය

(iv) කථිකයා තමා ඉදිරියේ සිටින සමූහය සමග ඇස් සම්බන්ධතාවය පවත්වා ගෙන යාම අතිශය වැදගත්ය. එය තම කථනය අවසානවන තෙක්ම අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

(v) සිතීම විදිමත් කිරීම, වාචික ප්‍රකාශනය, දැනුම සංරක්ෂණය....

(vi) කථන රටා පුහුණුවීම, අන් අයගේ කථන රටා අනුකරණය, තමා සතු තොරතුරු අදහස් පුළුල් කර ගැනීම, කථනය සඳහා පෙර සූදානම

(vii) සභාවට ඇති ලජ්ජාව සබකෝලයයි.

(viii) උච්චාරණය, අර්ථ ගැන්වීම, යෝග්‍යතාව

(ix) දෛනික ජීවිතය වෙනස් කිරීම / පරිභෝජන රටාව වෙනස් කිරීම / රසවින්දනය වෙනස් කිරීම ....

(x) ශාරීරික සාධකය / පාරිසරික සාධකය / සාමාජීය සාධකය (ලකුණු 02 × 10 = 20)

(02) (i) තැපැල් ලිපි, ෆැක්ස් පණිවිඩ, විද්‍යුත් තැපෑල, දුරකථන (ජංගම හා ස්ථාවර), අන්තර්ජාල දුරකථන, සමාජ ජාල වැනි නව මාධ්‍ය (ල. 01)

(ii) ශාරීරික ඉඟි හා ඉරියව්, මුහුණේ ඉඟි හා ඉරියව්, ඇස්වල හැසිරීම, ඇඳුම් හා පැළඳුම්, ස්පර්ශය, ගන්ධය, හඬ, උච්චාරණය හා නිහඬ බව. (ල. 02)

(iii) තොරතුරු සැපයීම, අධ්‍යාපනය ලබා දීම, විනෝදාස්වාදය ලබා දීම, පෙළඹවීම, සමාජනුයෝජනය, සංවාද හා සාකච්ඡා, සංස්කෘතික ප්‍රගමනය, ඒකබද්ධතාව (ල. 03)

(iv)
- ★ දුරකථන ඇමතුම ලබන්නා, ඇමතුම සක්‍රීය වූ විගස තමන්ගේ අනන්‍යතාව හෙළි කළ යුතුය.
- ★ දෙපාර්ශවයේම ගෞරවය රැකෙන පරිදි වචන භාවිත කළ යුතුය.
- ★ කිව යුතු දේ කෙටියෙන්ම පැවසිය යුතුය.
- ★ තමන් නොදන්නා අතහැරුණු ඇමතුම් වලට (missed calls) ඇමතීමෙන් වැලකිය යුතුය.
- ★ නොදන්නා කෙටි පණිවුඩ වලට පිළිතුරු දීමෙන් වැලකිය යුතුය. යනා දී....... කරුණු හතරක් (ල. 04)

(03) (i) අභිසාරිතාව යනු එකට හමුවීම යන්නයි. මෙහි දී ප්‍රමුඛ වන්නේ අන්තර්ජාලයයි. අන්තර්ජාලය නිසා සියලු මාධ්‍ය එක්රැස් වීමක් සිදු වේ. අන්තර්ජාලය මගින් පුවත්පත් කියවන්නටත්, ගුවන්විදුලියට සවන් දෙන්නටත්, රූපවාහිනිය නරඹන්නටත්, සිනමා පට නරඹන්නටත් හැකිය. තවද පොත් කියවන්නට හා දුරකථනයෙන් කතා කරන්නට හැකිය. මෙහි දී සිදු වන්නේ සියලු මාධ්‍ය එක් වීමකි. (ල. 1)

(ii)
- ★ සන්නවේදකයා එක් අයෙක් වන අතර, ග්‍රාහකයන් සමූහයක් වන නිසා ඔවුන් විවිධ වන්නට පුළුවන.
- ★ සන්නිවේදකයා හා ග්‍රාහකයින් අතර සම්බන්ධතාව යම් ප්‍රමාණයක දුරස්ථ භාවයක් ගනී.
- ★ කථිකයා ප්‍රමුඛ වන අතර ග්‍රාහකයා ද්විතිය වේ.
- ★ සන්දේශය වඩාත් තහවුරු කිරීමට ශ්‍රව්‍ය හා දෘශ්‍ය තාක්ෂණික මෙවලම් යොදා ගත හැකිය. යනාදී ...... කරුණු දෙකක් (ල. 02)

(iii) සන්නිවේදකයා මාධ්‍ය
ග්‍රාහකයා මාධ්‍ය
බලපෑම (ල. 03)

(iv)
- ★ සංදේශය පොදු වූවකි.
- ★ සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
- ★ සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ.
- ★ තාක්ෂණික උපකරණ භාවිතයට ගනී.
- ★ ග්‍රාහකය පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගනියි. (ල. 04)

(04) (i) ලැමිනේටින් යන්ත්‍රය, ස්ටෙප්ලර් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය, බැඳුම් උපකරණය (ල. 01)

(ii)
- ★ සන්නිවේදකයාට හා ග්‍රාහකයාට එකිනෙකා අවබෝධ කර ගනිමින් සන්නිවේදන කාර්යයෙහි නිරත විය හැකිය.
- ★ ග්‍රාහක ප්‍රතිචාර ඒ අවස්ථාවේදීම හඳුනාගත හැකිය.
- ★ භාවාත්මක හැඟීම් ප්‍රකාශ කිරීම වඩාත් සක්‍රීය වීම.
- ★ සන්නිවේදන තාක්‍ෂණික උපකරණ භාවිත කළ හැකි වීම. (ල. 02)

(iii) ගණක යන්ත්‍රයක් ලෙස, නිශ්චල ඡායාරූප ගැනීම, දින දර්ශනයක් ලෙස, දර්ශන වීඩියෝ කිරීම, වේලාව බැලීමට (ඔරලෝසුවක් ලෙස) විදුලි පන්දමක් ලෙස (ල. 03)

(iv) දින මුද්‍රාව / නිල මුද්‍රාව / ගණක යන්ත්‍රය / පරිගණකය පිළබඳව විස්තර කර තිබිය යුතුය. (ල. 04)

(05) (i)
- ★ විවිධ හැඩතල ලෑල්ල මත ගොඩනැගංවීම.
- ★ ඡායාරූපයක් ලෑල්ලේ රැඳවීම.
- ★ සිසුන්ගේ නිර්මාණ ලෑල්ලේ රැඳවීම.
- ★ විවිධ රූප ලෑල්ල මත ගොඩනැංවීම. (ල. 01)

(ii)
- ★ ඉගෙනුම්, ඉගැන්වීම්, පරිසරය ප්‍රියජනක වීම.
- ★ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් උද්යෝගීමත් හා ආකර්ශනිය බවට පත් වීම.
- ★ තොරතුරු ග්‍රහණය කර ගැනීම, මතකයේ රදවා ගැනීම, ග්‍රහකයාට පහසු වීම...... යනාදී කරුණු (ල. 02)

(iii)
- ★ කාර්යක්‍ෂම බව.
- ★ එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දීමට හැකිවීම.
- ★ සුරක්‍ෂිත බව.
- ★ අවම පිරිවැය.
- ★ ඡායාරූප, සිත්තම්, වීඩියෝ පට, සුභ පැතුම් පත යැවිය හැකිය..... (ල. 03)

(iv) ෆැක්ස් යන්ත්‍රය

මෙහි දී එක් ස්ථානයක ඇතුළු කරන යම් කඩදාසියක ඇති සටහන විද්‍යුත් තරංග බවට පත් කරයි. ඉන් පසු එම තරංග ග්‍රාහක යන්ත්‍රය වෙත ගමන් කරයි. එම යන්ත්‍රය විසින් එම විද්‍යුත් තරංග නැවත ලේඛනයේ ඇති සටහන බවට පත් කරයි. එහි පිටපතක් එම ග්‍රාහක යන්ත්‍රය විසින් මුද්‍රණය කර ලබා දෙයි.

වෙබ් අඩවි

අන්තර්ජාල පහසුකම් යොදා ගනිමින් යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් හෝ විසින් පවත්වා ගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු අතුලත් ගොනුවකි. කාර්යාලයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකිය. කාර්යාලීය තොරතුරු ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කළ හැකිය..... (ල. 04)

(06) (i) රූපවාහිනී සේවා - ජාතික රූපවාහිනිය / ITN රූපවාහිනිය
ගුවන්විදුලි - ලක්හඬ (ITN fm) / city fm / ස්වදේශීය සේවය (ල. 01)

(ii) ප්‍රවෘත්ති අංශය / වැඩසටහන් අංශය / දැන්වීම් අංශය

(iii)
- ★ ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේම නැරඹිය හැකිය.
- ★ අනවශ්‍ය ඡායාරූප මකා දැමිය හැකිය.
- ★ විද්‍යුත් තැපැල, අන්තර්ජාලය, ජංගම දුරකථනය වැනි සන්නිවේදන ජාලයන්ට පහසුවෙන් යොමු කළ හැකිය.
- ★ අඩු ආලෝක තත්වයක් යටතේ වුවද ඡායාරූප ගත හැකිය..... (ල. 03)

(iv) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය / අන්තර් ක්‍රියාකාරී පුවරුව පිළිබඳ විස්තර කර තිබිය යුතුය. (ල. 04)

(07) (i) යම් රසයක් හඳුනාගැනීමට හා විඳ ගැනීමට පුද්ගලයෙකු සතු හැකියාව රසඥතාවයයිත (ල. 01)

(ii) සාමාන්‍ය කාච / දුර රූප කාච / පටු කෝණ කාච / පුළුල් කෝණ කාච / යුහුමු කාච යන කාච අතරින් කාච දෙකක් පිළිබඳ විස්තර කර තිබිය යුතුය. (ල. 02)

(iii) වාචික සන්නිවේනය / ශ්‍රව්‍ය සන්නිවේදනය / අවාචික සන්නිවේදනය / දෘශ්‍ය සන්නිවේදනය / ලිඛිත සන්නිවේදනය / මේ අතුරින් තුනක් පිළිබඳ විස්තර කර තිබිය යුතුය. (ල. 03)

(iv) තනිදාමය / ඕපාදූප දාමය / සම්භාවිතා දාමය / පර්ෂද දාමය යනාදිය අතුරින් ආකෘති දෙකක් නිවැරදිව ඇඳ විස්තර කර තිබිය යුතුය. (ල. 02)